## 1. ලියාපදිංචිය සදහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් හා ලියවිලි

- ❖ වයස අවුරුදු 18 ට වැඩි විය යුතුය.
- ❖ ස්ත්‍රී/ පුරුෂ දෙපාර්ශවයටම අයදුම් කල හැකිය.
- ❖ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකය හා පළපුරුද්ද.
- ❖ රාජ්‍ය / පෞද්ගලික ආයතනයන්හි හෝ ස්වයංව ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවයේ නියුතු වීම.

### පළපුරුද්ද සනාථ කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග

**NVQ** සහතිකපත්ලාභියා පිළිගත් රාජ්‍ය ආයතනයක සේවය කරයි නම් අදාළ ආයතනයෙන් ලබා ගත් සේවා සහතිකය සහ ආයතන ප්‍රධානියා / බලය ලත් නිලධාරී විසින් අයදුම්පතෙහි අදාල සේවා කාලය අනුමත කොට (නිල මුද්‍රාව සහිතව) අයදුම්පත ඉදිරිපත් කල යුතුය. අවශ්‍යතාවය අනුව CIDA ආයතනය මගින් සේවය කරන ආයතනය සම්බන්ධ කරගෙන සේවා කාලය තහවුරු කරගනු ලැබේ

**NVQ** සහතිකපත්ලාභියා පෞද්ගලික ආයතනයක සේවය කරයි නම් අදාළ ආයතනයෙන් ලබා ගත් සේවා සහතිකය හා එම ආයතනය ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ ආයතනයක් නම් කොන්ත්‍රාත්කරු (CIDA ලියාපදිංචි) / බලය ලත් නිලධාරී හෝ ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ නොවන ආයතනයක් නම් ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී විසින් අයදුම්පතෙහි අදාළ සේවා කාලය අනුමත කොට (නිල මුද්‍රාව සහිතව) අයදුම්පත ඉදිරිපත් කල යුතුය. CIDA ආයතනය මගින් සේවය කරන ආයතනය සම්බන්ධ කරගෙන සේවා කාලය තහවුරු කරගනු ලැබේ.

**NVQ** සහතිකපත්ලාභියා ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ ස්වයං රැකියාවක නියැලෙන්නේ නම් ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී විසින් අයදුම්පතෙහි අදාළ සේවා කාලය අනුමත කොට (නිල මුද්‍රාව සහිතව) අයදුම්පත ඉදිරිපත් කල යුතුය.

**NVQ** සහතිකපත්ලාභියා නැවත පැමිණි විදේශ සංක්‍රමික ශ්‍රමිකයකු නම් විදේශගත වීමේදී, විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් නිකුත් කල සහතිකය, සේවා සහතිකය හා වීසා සහතික ඉදිරිපත් කල යුතු අතර ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී විසින් අයදුම්පතෙහි අදාළ සේවා කාලය අනුමත කොට (නිල මුද්‍රාව) සහිතව අයදුම්පත ඉදිරිපත් කල යුතුය.

## 2. ගෙවීම් හා අයදුම්පත් ඉදිරිපත් කිරීම

එක් ක්ෂේත්‍රයක් සඳහා අයදුම්පත ඉදිරිපත් කිරීමේදී සකස් කිරීමේ ගාස්තුව රු 500.00 කි.
ගෙවීම් මුදල් ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ ''සභාපති, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය'' නමින් ඇති 77454975 අංක දරණ බැංකු ගිණුමට බැර කර මුදල් තැන්පත් කිරීමේ පත්‍රිකාවේ පිටපත (රිසිට් පත) මෙම අයදුම් පතට අමුණා එවිය යුතුය.

- ❖ පහත සඳහන් එක් ක්‍රමයකින් අයදුම්පතක් ලබා ගත හැකිය.
  ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකරිය (CIDA) සහ අනුබද්ධිත ආයතන (CETRAC, CHPB, OTC)
  CIDA දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන්ගෙන්
  CIDA වෙබ් අඩවිය www.cida.gov.lk
- ❖ වෘත්තීන් කිහිපයක් සදහා අයදුම් කරන්නේ නම් එක් එක් වෘත්තීන් සදහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- ❖ සම්පූර්ණ කරන ලද අයදුම්පත්
  CIDA දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් මගින් හෝ
  පෞද්ගලිකව ඔබ විසින්ම හෝ ලියාපදිංචි තැපැල් මගින් පහත ලිපිනයට ලැබෙන්නට සලස්වන්න
  **අධ්‍යක්ෂ ජනරාල්, "සව්සිරිපාය", 123, විජේරාම මාවත, කොළඹ 07.**

අයදුම්පත බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ''නිපුණ ඉදිකිරීම් ශ්‍රමිකයෙකු ලෙස ලියාපදිංචිය'' ලෙස සඳහන් කරන්න.



## 3. නව ලියාපදිංචිය /ශ්‍රේණිය උසස් කර ගැනීම / ලියාපදිංචිය අලුත් කර ගැනීම පටිපාටිය

- ❖ ඔබ විසින් අප වෙත එවන අයදුම්පත සහ අදාළ සහතික විශේෂ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පරීක්ෂාවට ලක් කරනු ඇත.
- ❖ එහිදී අයදුම්පතේ සඳහන් තොරතුරු හා ඉදිරිපත් කර ඇති ලේඛණවල සත්‍යතාවය තහවුරු කරගැනීමට කටයුතු කරනු ලැබේ.
- ❖ ඒ අනුව ඉදිකිරීම් ශිල්පියකු ලෙස ලියාපදිංචිය ලබා දීම සදහා ඔබ මූලික සුදුසුකම් ලබා ඇතිබව සනාථ වුවහොත් ඔබ වෙත නව ලියාපදිංචිය/ අලුත් කිරීමේ/ ශ්‍රේණිය උසස් කර ගැනීමේ ගාස්තුව රු 1500.00 ගෙවීමට හා ලබා ඇති වෘත්තීය පළපුරුද්ද පිළිබඳ තහවුරු කිරීම සඳහා පැවැත්වෙන වෘත්තීය පරීක්ෂණය පවත්වන දිනය ඔබට අධිකාරිය විසින් ලිඛිතව දැනුම් දෙනු ලැබේ. (CIDA වෙබ් අඩවිය www.cida.gov.lk වෙතින් ද නිරීක්ෂණය කල හැකිය.)

| අංකය | කාණ්ඩය හා ශ්‍රේණිය | අවම සුදුසුකම් හා පළපුරුද්ද |
|---|---|---|
| 1 | ප්‍රධාන ශිල්පී | NVQ – 4 මට්ටම හා වසරක පළපුරුද්ද හෝ ඒ හා සමාන අධිකාරිය මගින් පිළිගත් සුදුසුකම් |
| 2 | ශිල්පී | NVQ – 3 මට්ටම මාස 6ක පළපුරුද්ද හෝ NVQ)4 මට්ටම හෝ අධිකාරිය මගින් පිළිගත් ඒ හා සමාන සුදුසුකම් |

- ❖ ස්ථිර ලියාපදිංචිය වලංගු වන්නේ වසර 05 ක් සදහා පමණි. ඉන් පසුව ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සිදු කල යුතුය.
- ❖ යාවත්කාලීන කිරීම සඳහා නැවත අයදුම්පත් පුරවා ඉදිරිපත් කල යුතුය.
- ❖ ලියාපදිංචියේ කල් ඉකුත් වීමට තෙමසකට පෙර නව අයදුම්පත්‍රය ඉදිරිපත් කල යුතුය.
- ❖ ඉදිකිරීම් ශ්‍රමිකයෙකු ලෙස ලියාපදිංචිය ලබා දීම සඳහා ඔබ කුසලතා පරීක්ෂණය (Skills Test) සමත් විය යුතුය.
- ❖ ඔබගේ ලියාපදිංචිය සනාථ කිරීමට
  ලියාපදිංචි වූ බවට සහතිකය / ශිල්පී හැදුනුම්පත නිකුත් කිරීම හා
  නිපුණ ඉදිකිරීම් ශ්‍රමික CIDA නාම ලේඛනයට ඔබගේ ලියාපදිංචිය ඇතුලත් කිරීම සඳහා කටයුතු සිදු කරනු ලැබේ.
- ❖ ශිල්පී හැදුනුම්පතෙහි ගෙවීම්
  - i. නව ශිල්පී හැදුනුම්පත නිකුත් කිරීම - ලියාපදිංචි කිරීමේ ගාස්තුවලට ඇතුලත් කොට ඇත.
  - ii. හැදුනුම්පත අලුත් කිරීම (වසර 5 කට වරක්) - ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුවලට ඇතුලත් කොට ඇත.
  - iii. හැදුනුම්පතෙහි ශ්‍රේණිය ඉහල දැමීම - රු. 300.00
  - iv. නැති වූ හෝ හානි වූ ශිල්ප හැදුනුම්පත වෙනුවට ශිල්ප හැඳුනුම්පතෙහි අනුපිටපතක් නිකුත් කිරීම (දඩ) - රු. 400.00

## ප්‍රතිලාභ

- ❖ ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි ඔබ පිළිබඳව වෘත්තීයමය පිළිගැනීම වැඩි දියුණු කිරීම.
- ❖ ඔබගේ දක්ෂතාවය තක්සේරු කිරීම සඳහා අවශ්‍ය / ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකය ලබා ගැනීමට පෙළඹවීම.
- ❖ ඔබගේ ලියාපදිංචිය පිළිබඳ තොරතුරු CIDA වෙබ් අඩවියට ඇතුලත් කර එමගින් ඔබගේ සේවාව ලබා ගැනීමට අපේක්ෂා කරන පාර්ශවයන් හට සෘජුවම ඔබ හා සම්බන්ධවීමට හැකියාව ලබා දීම.
- ❖ ලියාපදිංචි ඉදිකිරීම් ශ්‍රමිකයන් පමණක් හදුනා ගත් ඉදිකිරීම් වැඩවල නියලෙන බව සහතික කිරීම.
- ❖ යම් වෘත්තියක නිපුණතාවක් සතුවේ නම් හැඳුනුම්පතක් නිකුත් කිරීම.